සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 11 S

# බුද්ධ ධර්මය - I කොටස

නම .............................................. | කාලය පැය දෙකයි

උපදෙස් :
- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 02 බැගින් ලකුණු 40 ක් හිමි වේ.

✶ අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) බුදුරජාණන් වහන්සේ සත් සතිය ගත කළ ආකාරය දැක්වෙන ගාථා පාඨය මින් කුමක් ද?
- i. "ඕවාද සිප්ප දානේන" යන ගාථා පාඨය යි.
- ii. "පඨමං බෝධි පල්ලංකං" යන ගාථා පාඨය යි.
- iii. "අංගාරි නෝදානි දුමා භදන්තේ" යන ගාථා පාඨය යි.
- iv. "න පරෝ පරංනිකුබ්බේථ" යන ගාථා පාඨය යි.

(2) අප මහා බෝසතාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වූ පුර පසළොස්වක පොහෝ දිනය වන්නේ
- i. බිනර පුර පසළොස්වක පොහෝ දිනය යි.
- ii. පොසොන් පුර පසළොස්වක පොහෝ දිනය යි.
- iii. වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය යි.
- iv. ඇසළ පුර පසළොස්වක පොහෝ දිනය යි.

(3) බුදුරජාණන් වහන්සේ කළගුණ සැලකීමේ ගුණය ලොවට ආදර්ශයෙන් පෙන්වා දුන්නේ සත් සතියෙන් කීවෙනි සතියේදී ද?,
- i. පළමුවැනි සතියේ දී.
- ii. දෙවැනි සතියේ දී.
- iii. තුන්වැනි සතියේ දී.
- iv. හතරවැනි සතියේ දී.

(4) බුදුරජාණන් වහන්සේ රෝගීන්ට උපස්ථාන කිරීමේ වටිනාකම ආදර්ශයෙන් ම ලොවට පෙන්නුම් කළ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකි. එම ගුණය හඳුන්වන්නේ,
- i. මහා කරුණා ගුණය නමිනි.
- ii. අසරණ සරණ ගුණය නමිනි.
- iii. යථාවාදී තථාකාරී ගුණය නමිනි.
- iv. ගිලානෝපස්ථානය නමිනි.

(5) උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,
- i. රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීමයි.
- ii. රෝගියා කෙරෙහි නොරුස්නා ගතියක් පෙන්වීමයි.
- iii. මළ මූත්‍රා ආදිය කෙරෙහි පිළිකුල් නූපද වීමයි.
- iv. රෝගියාගේ සිත සැනසෙන කථා පැවසීමයි.

(2 x 5 = 10)

★ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරිනම් (√) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද යොදන්න.

(6) පටාචාරා අනපේක්ෂිත අයුරින් විපත් රැසකට මුහුණ දුන් කාන්තාවකි. (   )

(7) බුදුරජාණන් වහන්සේ පූතිගත්ත තිස්ස තෙරුන්ට ඇප උපස්ථාන කිරීමට උදව් ලබා ගත්තේ සැරියුත් තෙරණුවන්ගෙන් ය. (   )

(8) බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම ආරම් කරන ලද්දේ මැදින් පුර පසළොස්වක පොහොය දිනයක ය. (   )

(9) වසරක් ගතවන විට බුද්ධ ශාසනයේ රහතන් වහන්සේලා ගණන දස දහසක් විය. (   )

(10) නව අරහාදී බුදුගුණ අපගේ බිය සැක දුරුකර ගැනීමට මහත් රුකුලක් වේ. ( )

( 2 x 5 = 10)

★ **ප්‍රශ්න අංක 11 සිට ප්‍රශ්න අංක 15 දක්වා දී ඇති ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

(11) ............................................... පාඨය මගින් බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ බුදුගුණ විස්තර කර තිබේ.
(ඉතිපිසෝ භගවා අරහං, ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ, සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ)

(12) කෝසල රාජ්‍යයේ අගනගරය වූ .................................................. සුමන නම් සිටුවරයෙක් වාසය කළේය.
(සැවැත් නුවර, කිඹුල්වත් නුවර, කොසඹෑ නුවර)

(13) බුදුරජාණන් වහන්සේ දිවි ගෙවූ පන්සාලිස් වසක කාලයෙන් .................................................. වසක් වාසය කර ඇත්තේ සැවැත්නුවර ජේතවනාරාමයේය.
( විසිඑක්, දහ අට, දහනව)

(14) .................................................. දියණිය වැස්සේ තෙමි තෙමී සුපුරුදු සන්සුන් ගමනින් අසල තිබූ ශාලාවකට පැමිණියාය.
( විශාඛා, උත්පලවණ්ණා, ඛේමා )

(15) වැසි නොවැටෙන වියළි සමය .................................................. ඍතුව නමින් හඳුන්වනු ලබයි.
( වසන්ත, ගිම්හාන, හේමන්ත)

(2 x 10 = 10)

★ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වල "අ" තීරුවට ගැළපෙන පිළිතුර "ආ" තීරුවෙන් තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න.**

| | "අ" තීරුව | | "ආ" තීරුව |
|---|---|---|---|
| (16) | බුදු සසුනේ අග්‍ර දායිකාව | ( ) | 1. සත්ථා දේව මනුස්සානං |
| (17) | සෝවාන් වූ පළමු රජතුමා | ( ) | 2. සුමනා |
| (18) | නව අරහාදී බුදුගුණ | ( ) | 3. කාව්‍ය ශේඛරය |
| (19) | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි | ( ) | 4. විශාඛා සිටු දියණිය |
| (20) | අනේපිඬු සිටුතුමාගේ දියණිය | ( ) | 5. බිම්බිසාර රජතුමා |

(2 x 10 = 10)

## II කොටස

★ **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 02 බැගින් ලකුණු 20ක් හිමිවේ.**

(01)

i. පෙර භවයකදී කළ අකුසලයක් හේතුවෙන් දරුණු කුෂ්ඨ රෝගයකට ගොදුරු වූ ස්වාමීන් වහන්සේගේ නම කුමක් ද?
ii. ගිලානෝපස්ථානයේ වටිනාකම ලොවට පෙන්නුම් කළ ශාස්තෘවරයා කවුරුන් ද?
iii. බුදුරජානන් වහන්සේ සමඟ කිඹුල්වත්පුර ගමනට සහභාගී වූ රහතන් වහන්සේලා සංඛ්‍යාව කොපමණ ද?
iv. "රජතුමනි, මට පැවිදිවීමට අවසර ලබාදෙන්නේ නම් මම ඒ දේ ඉටු කරමි" යනුවෙන් පැවසුවේ කවුරුන් ද?
v. පස්වග තවුසන් රහත් භාවය ලැබුවේ කුමන සූත්‍ර දේශනාවක් ශ්‍රවණය කිරීමෙන් ද?
vi. සමස්ථ සත්ව ප්‍රජාවට ම මෙත් වැඩීම සඳහා උපකාර කරගත හැකි භාවනාව කුමක් ද?
vii. ජේතවනාරාමය ඉදිකිරීම සඳහා වැය කරන ලද කහවනු ප්‍රමාණය කොපමණ ද?
viii. තෙරුවන් නම් කරන්න.
ix. ධනංජය සිටුතුමා තම දියණියට යුග දිවිය සාර්ථක කර ගැනීමට ලබාදුන් උපදෙස් ගණන කීය ද?
x. විශාඛා උපාසිකාව විසින් ඉදිකර ශාසනයට පූජා කළ ආරාමය කුමක් ද?

(ලකුණු 2 x 10 = 20)

(02) i. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස ආරාධනා කළේ කවුරුන් ද?
(ල.02)

ii. යස කුල පුත් පැවිදිවීමේ ආරංචිය අසා පැවිදි වූ ඔහුගේ හොඳම මිතුරන් හතර දෙනෙකුගෙන් තිදෙනෙකු නම් කරන්න.
(ල.03)

iii. අධ්‍යාපන කටයුතු හොඳින් පවත්වාගෙන යාමට කල්‍යාණ මිත්‍රයකුගෙන් ගතහැකි ප්‍රයෝජන 5ක් ලියන්න.
(ල.05)

(03) i. පංචශීලයට අයත් සිල්පද වලින් දෙකක් නම් කරන්න.
(ල.02)

ii. ඔබ නම් කළ එක් සිල්පදයක් කෙටියෙන් පහදන්න.
(ල.03)

iii. කය සහ වචනය සංවර කර ගැනීමෙන් යහපත් සිසු දරුවෙකු නිර්මාණය කරගත හැකිය. යහපත් සිසු දරුවෙකු තුළ දැකිය හැකි හොඳ ලක්‍ෂණ 5 ක් සඳහන් කරන්න.
(ල.05)

(04) i. අප බෝධිසත්වයාණන් වහන්සේ සම්මා සම්බුද්ධතවයට පත්වූයේ කුමන ස්ථානයේදී ද?
(ල.02)

ii. බුදුන් දහම් සරණ ගිය පළමු උපාසකවරුන් නම් කර ඔවුන් බුදුන්ට පූජා කළ ද්‍රව්‍ය සඳහන් කරන්න.
(ල.03)

iii. බුදුරජණාන් වහන්සේ සත් සතිය ගතකළ අයුරු කෙටියෙන් සඳහන් කරන්න
(ල.05)

(05) i. "මාතා යථා නියං පුත්තං" යන ගාථා පාඨය ඇතුළත් වන්නේ කුමන සූත්‍රයේ ද?
(ල.02)

ii. ඉහත ගාථාවේ සරල අදහස ලියන්න.
(ල.03)

iii. ඉහත සූත්‍රයට අනුව හොඳ දරුවෙකු වශයෙන් ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග මොනවා ද?
(ල.05)

(06) i. බුදු සසුනට පූජා කළ ප්‍රථම ආරාමය නම් කර, එය පූජා කළ රජතුමාගේ නම ලියන්න.
(ල.02)

ii. අසරණ සරණ ගුණයෙන් පිහිට ලැබූ අසරණ පුද්ගයන් තිදෙනෙකු නම් කරන්න.
(ල.03)

iii. පාසල් දරුවකු වශයෙන් අසරණ සරණ ගුණය ඔබ තුළ වර්ධනය කර ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
(ල.05)

(07) පහත සඳහන් කොටස් වලින් එක් මාතෘකාව බැගින් තෝරාගෙන මාතෘකා දෙකකට කෙටි සටහන් සපයන්න.

| I කොටස | II කොටස |
|---|---|
| 1. සිරිත් විරිත් | 1. අනේපිඬු සිටුතුමා |
| 2. පුරිස ධම්ම සාරථී ගුණය | 2. උපතිස්ස හා කෝලිත |

(5x2 = 10)

# පළමු වාර පරීක්ෂණය - 2019

## බුද්ධ ධර්මය (පිළිතුරු පත්‍රය) 7 ශ්‍රේණිය

### I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ii | 6. | √ | 11. | ඉතිපිසෝ භගවා අරහං |
| 2. | iii | 7. | X | 12. | සැවැත් නුවර |
| 3. | ii | 8. | √ | 13. | දහනව වසක් |
| 4. | i | 9. | X | 14. | විශාඛා උපාසිකාව |
| 5. | ii | 10. | √ | 15. | ගිම්හාන සෘතුව |

16. - iv
17. - v
18. - i
19. - iii
20. - ii

### II කොටස

(1)
(I) පූතිගත්ත තිස්ස තෙරණුන් වහන්සේ.
(ii) බුදුරජාණන් වහන්සේ.
(iii) විසි දහසකි.
(iv) කාළුදායී ඇමතිවරයා.
(v) අනත්තලක්ඛණ සූත්‍රය.
(vi) මෛත්‍රී භාවනාව
(vii) කහවනු දහ අට කෝටියකි.
(viii) බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය.
(ix) දහයකි.
(x) පූර්වාරාමය.

(2) I. සහම්පතී මහා බ්‍රහ්මයා
II. විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පති.
III. ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන සළකා බලා ලකුණු ප්‍රදානය කරන්න.

(03) I. පන්සිල් පද 05 න් ඕනෑම දෙකක් නම් කර තිබීම.
II. සිසුවාට කැමති එක් සිල් පදයක තේරුම හා ඒ සම්බන්ධයෙන් ලියා ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න.
III. කය / වචනය සංවර කර ගැනීම මගින් දරුවන් තුළ දැකිය හැකි හොඳ ලක්ෂණ ඇතුලත් පිළිතුරක සමස්ථය ගැන බලා ලකුණු දෙන්න.

(04) I. වෙසක් පුර පසළොස්වක පෝය දිනය.
II. තපස්සු භල්ලුක. අත්සුණු හා මී පිඬු
III. ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන බලා ලකුණු ප්‍රදානය කරන්න.

(05) I. මහා මංගල සූත්‍රය
II. එකම පුතෙකු ඇති මවක් දිවි හිමියෙන් තම පුතු ආරක්ෂා කරන්නේ යම් සේද එවැනි වූ මෛත්‍රියක් සියලු සත්ත්වයා කෙරෙහි පැතිර විය යුතුය.
III. ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන සැළකලිමත් වී ලකුණු ප්‍රදානය කරන්න.
(06) I. වේළුවනාරාමය, බිම්බිසාර රජතුමා.
II. සුනීත, සෝපාක, පටාචාරා, අසරණ මහලු පියා, වරදට හසු වූ නිවැරදි ගොවියා, සැදි.......
III. ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන සැලකිලිමත්ව ලකුණු ප්‍රදානය කරන්න.
(07) එක් කොටසකින් එක් මාතෘකාව බැගින් තෝරා ගෙන ලියා ඇති කරුණු වල නිරවද්‍යතාවය හා ගැලපීම ගැන සොයා බලා අවශ්‍ය පරිදි ලකුණු ප්‍රදානය කරන්න.